# වික්ටෝරියානු වාර්ගිකත්වයට එරෙහි උපායමාර්ගය

## 2024-2029 බැලූ බැල්මට පෙනෙන දෙය

වික්ටෝරියාවේ පළමු සමස්ථ රාජ්‍ය වාර්ගිකත්වයට එරෙහි උපායමාර්ගය **වික්ටෝරියාව තුල වර්ගවාදය සහ වෙනසකට ලක් කිරීම නැවැත්වීම** සඳහාවූ වසර 5 ක සැලැස්මකි.

එක්ව කටයුතු කිරීම මගින් සැමදෙනා ඇතුලත් බව හැඟෙන වඩා සාධාරණ සහ වඩා ආරක්ෂාකාරී වික්ටෝරියාවක් ගොඩ නැගිය හැක.

### වර්ගවාදය යනු කුමක්ද?

වර්ගවාදය යනු වෙනසකට ලක් කිරීමේ එක් අංගයක් වන අතර මෙහිදී සිය ජාතිය හෝ වාර්ගිකත්වය පදනම් කරගෙන ඔවුන්ට අසාධාරණ ලෙස සලකනු ලබයි. යට වාචික පරිභව කිරීම, බැහැර කිරීම හෝ අනෙක් අයට ඇති ප්‍රවේශය තමාට අහිමි කිරීම ඇතුලත් විය හැක.

වර්ගවාදයම විවිධ ආකාර විය හැකිය. මෙම උපායමාර්ගය මගින් පහත ස්ථානවල වර්ගවාදය ඇමතීම සිදු කරයි:

- ප්‍රජාව තුල
- සංවිධාන සහ ආයතන තුල
- නීතිය, ප්‍රතිපත්ති සහ ක්‍රම තුල.

## අපගේ දැක්ම

සියළුම වික්ටෝරියානුවන් සමාන අයිතිවාසිකම්, නිදහස සහ ආරක්ෂාව භුක්ති විඳින, ආරක්ෂාකාරී, සෞඛ්‍ය සම්පන්න සහ උපකාරී ප්‍රජා තුල සාර්ථකව ජීවත්වන වර්ගවාදය සහ වෙනසකට ලක්කිරීමෙන් තොර වික්ටෝරියාවක්.

**උපාය මාර්ගය තුල වික්ටෝරියාවේ වර්ගවාදය සහ වෙනසකට ලක් කිරීම අඩු කරන අරමුණු 4 ක් ඇත:**

**1 වන අරමුණ.**
**වර්ගවාදී ආකල්ප, හැසිරීම් සහ විශ්වාස හඳුනාගෙන, ඒවා අභියෝග කර ප්‍රතික්ෂේප කිරීම.**

**2 වන අරමුණ.**
**රජයේ සේවා සහ රාජකාරී ස්ථාන ආරක්ෂාකාරී, ප්‍රවේශ විය හැකි සහ වෙනසකට ලක් නොකරන ස්ථානවීම.**

**3 වන අරමුණ.**
**සියළුම ක්ෂේත්‍රවල සහභාගිත්වයට, ප්‍රගතියට ආරක්ෂාවට සහ සාර්ථකත්වයටවර්ගවාදය සහ වෙනසකට ලක් කිරීම තවදුරටත් බාධා නොවීම**

**4 වන අරමුණ.**
**වර්ගවාදයට භාජනය වන අය හට නිසි සහ සංස්කෘතිමය වශයෙන් ආරක්ෂාකාරී සේවා සහ උපකාර ලැබීම**

## අරමුණු මත කටයුතු කිරීම

වර්ගවාදයට එරෙහි උපායමාර්ගය මගින් පහත දේ සිදු කරනු ඇත:

- **ප්‍රජා ක්‍රීඩාවලසිදුවන** වර්ගවාදය ඇමතීම සඳහා ප්‍රාන්තය පුරා ව්‍යාපාරයක් සිදු කිරීම
- ප්‍රාදේශීය මට්ටමේ වර්ගවාදය අභියෝග කිරීමට **ප්‍රාජව මගින් නායකත්වය ලබා දෙන කටයුතුවලට උපකාර කිරීම**
- වෛරී කථනය සහ හැසිරීමට එරෙහිව ඇති **ආරක්ෂාව සහ නීතීන්** ශක්තිමත් කිරීම
- සංවිධාන මගින් **වර්ගවාදයට අදාල පැමිණිලි වාර්තාවලට**ප්‍රතිචාර දක්වන ආකාරය වැඩි දියුණු කිරීම
- **පොලිස් කටයුතුවලදී** වර්ගවාදය සහ වෙනසකට ලක් කිරීම අඩු කිරීම
- **සේවායෝජකයන් සහ සංවිධාන** මගින් වර්ගවාදය වළක්වන සහ එයට ප්‍රතිචාර දක්වන ආකාරය වැඩිදියුණු කිරීම
- වර්ගවාදය අත්විඳි අය හට උපකාර කරන **ප්‍රාදේශීය උපකාර ජාල** ශක්තිමත් කිරීම.

වර්ගවාදය අඩුකිරීම සම්බන්ධයෙන් උපාය මාර්ගය මගින් ඇතිකරනු ලබන බලපෑම අපි මනින අතර අපගේ ප්‍රගතිය සම්බන්ධයෙන් අපි ප්‍රජාව වෙත වාර්තා කරමු.

VICTORIA State Government


# අපට මෙම උපාය මාර්ගය අවශ්‍ය වන හේතුව

වික්ටෝරියානුන්ගෙන් වැඩි දෙනෙක් පැමිණෙන්නේ

**ප්‍රවේණි 300 කට අධික ප්‍රමානයකින්ය**

භාෂා **සහ උප භාෂා290 ක් කථා කරයි**

විවිධ විශ්වාස **200 කට ආසන්න ප්‍රමාණයක් අදහයි**



වික්ටෝරියානුවන්ගෙන් **30%** ක් විදේශවල ඉපදී ඇත



ඕස්ට්‍රේලියානු පළමු ජනතාවගෙන් **8%** ක් ජීවත් වන්නේ වික්ටෝරියාව තුලය.

2022, **දී පළමු ජනතාවගෙන් 5 න් 3 ක් (60%)** ඕස්ට්‍රේලියාව තුල වර්ගවාදය අත්විඳි බවට වාර්තා කර ඇත

2023 දී, **ජනතාවගෙන් 5 න් 1 ක් (18%)** ඕස්ට්‍රේලියාව තුල වර්ගවාදය අත්විඳි බවට වාර්තා කර ඇත

**ඕස්ට්‍රේලියානුවන්ගෙන් 5 න් 3 ක් (63%)** ආසියා අප්‍රිකා හෝ මැද පෙරදිග හෝ ක්‍රිස්තියානි නොවන ආගමක් යන එක් හෝ වැඩි කොටසක් සම්බන්ධයෙන් ඍණකාරී අදහස් ඇත

**ඕස්ට්‍රේලියානුවන්ගෙන් 5 න් 3 ක්** (62%) වර්ගවාදය 'ඉතා විශාල' හෝ 'සෑහෙන විශාල' ගැටළුවක් ලෙස දකී.

**තොරතුරු මද කම හෝ සේවා සම්බන්ධයෙන් ප්‍රජාව තුල ඇති විශ්වාසය අඩුවීම මගින් අදහස් වන්නේ වර්ගවාදය ඇති පමණට වාර්තා නොවන බවයි.**

## අප කථා කලේ කවුරුන් සමඟද



පළමු පළමු ජනතාව, බහුසංස්කෘතික සහ බහු ආගම් අදහන වික්ටෝරියානුවන් **670 දෙනෙකුට වැඩි දෙනෙකුට අපි සවන් දුනිමු**. මේ අය අතර ප්‍රජා නායකයන්, විශේෂඥයන් සහ මුල්පෙළේ රාජකාරී කටයුතු කරන්නත් සිටින ලදී.

## වික්ටෝරියාවේ වර්ගවාදය වාර්තා කිරීම



කිසිවෙකු විසින් වර්ගවාදය ඉවසා දරා සිටිය යුතු නැත.ඔබ වර්ගවාදය හෝ වෙනසකට ලක් කිරීම වික්ටෝරියාව තුල අත්විඳියහොත් හෝ ඇසින් දුටුවහොත් ඔබට වාර්තා කල හැක,

### වික්ටෝරියානු සමාන අයිතිවාසිකම් සහ මානව හිමිකම් කොමිසම

සතියේ දිනවල පෙව 10 සිට පව 2 දක්වා දුරකථන අංක 1300 292 153 අමතන්න. ඔබට භාෂණ පරිවර්තකයෙකු අවශ්‍ය නම් දුරකථන අංක 1300 152 494 අමතන්න.

ඊමේල් **enquiries@veohrc.vic.gov.au**.

**අවිධිමත් වාර්තාවක් මාර්ගගතව සිදු කරන්න**
<online<https://www.humanrights.vic.gov.au/get-help/community-reporting-tool/>.

**ජාතික රිලේ සේවාව සමඟ සම්බන්ධ වන්න**
<https://www.humanrights.vic.gov.au/get-help/contact-us/>.

### වික්ටෝරියා පොලීසිය

ආපදා තත්ව, සිදුවන අපරාධයක් වාර්තා කිරීමට හෝ හදිසියේ පොලිස් පැමිණීම අවශ්‍ය නම්, බිංදු තුන (000) අමතන්න.

හදිසි ආපදා නොවන කරුණු සඳහා, දුරකථන අංක 131 444 ඔස්සේ පොලිස් උපකාර මාර්ගය හෝ නොමිළේ භාෂණ පරිවර්තකයෙකු සඳහා දුරකථන අංක 131 450 අමතන්න.

ඔබගේ පළාතේ පොලිස් ස්ථානය වෙත ගොස් හෝ **මාර්ගගතව** <https://www.police.vic.gov.au/police-assistance-line-and-online-reporting>පැමිණිල්ලක් සිදු කල හැක.

දුරකථන අංක 1800 333 000 ඔස්සේ අපරාධ නවත්තන්නන් හට නිර්නාමිකව නැතිනම් <www.crimestoppers.com.au> වෙත වාර්තා කල හැක

**වැඩිදුර උපකාර සහ පැමිණිලි විකල්ප සඳහා** කරුණාකර **වික්ටෝරියාවේ වර්ගවාදයට එරෙහි උපාය මාර්ගය** වෙබ්අඩවිය වන <https://vic.gov.au/victorias-anti-racism-strategy>වෙත පිවිසෙන්න

## වැඩිදුර විස්තර

සම්පූර්ණ උපාය මාර්ගය ඉංග්‍රීසි භාෂාවෙන් හෝ මෙම සාරාංශය වෙනස් භාෂාවලින් **මාර්ගගතව** <https://vic.gov.au/victorias-anti-racism-strategy> කියවා ගත හැක.
වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක 131 450 ඔස්සේ පරිවර්තන සහ තෝල්ක සේවාව (TIS) අමතා දුරකථන අංක 03 9651 5111 ඔස්සේ අග්‍රාමාත්‍ය සහ කැබිනට් දෙපාර්තමේන්තුව ඇමතිය හැකිය, නැතිනම් <antiracism.strategy@dpc.vic.gov.au> ඊමේල් පණිවුඩයක් **අග්‍රාමාත්‍ය සහ කැබිනට් දෙපාර්තමේන්තුව** වෙත යැවිය හැක.

අනුමැතිය සහ ප්‍රකාශයට පත් කිරීම, 1 ට්‍රෙෂරි ප්ලේස්, මෙල්බර්න්හි වික්ටෝරියානු රජය විසිනි.

©අග්‍රාමාත්‍ය සහ කැබිනට් දෙපාර්තමේන්තුව, වික්ටෝරියා ප්‍රාන්ත, ඕස්ට්‍රේලියා, 2024 නොවැම්බර්.

ISBN 978-1-923294-13-4 (මාර්ගස්ථ/පී.ඩී.එෆ්./වර්ඩ්) හෝ (මුද්‍රිත)

**වික්ටෝරියාවේ වර්ගවාදයට එරෙහි උපාය මාර්ග 2024-2029** වෙතින් ලබාගත හැක <https://vic.gov.au/victorias-anti-racism-strategy>

ඇතුළු මුද්‍රණ සමාගමේ නම, තදාසන්න ප්‍රදේශය මගින් මුද්‍රණය කර ඇත (insert design job number in brackets)